---

## ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය සභාව

## මාතලේ දිස්ත්‍රික්කය

---

### 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 04 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 20 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ජූලි 09 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

(අ) නියඟය බලපා ඇති ප්‍රදේශවලට ජලය සැපයීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යංශයෙන් ලැබී සභා භාරයට ගෙන තිබූ ලීටර 1000 ජල ටැංකි 13 ක වටිනාකම ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් ගිණුම් හා ප්‍රාග්ධන ගිණුමට ආදායමෙන් දායකවීම් ගිණුමේ ශේෂය සමාන විය යුතු වුවත් එම ශේෂවල රු: 4,146,848 ක වෙනසක් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට බැංකුවේ තැන්පත් නොකළ අත ඉතිරි මුදල් ලෙස රු: 17,737 ක ශේෂයක් පැවති අතර එය ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ජල පාරිභෝගිකයන් 111 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබූ රු: 440,325 ක මුදලක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඉ) අවිනිශ්චිත ගිණුමට කරනු ලබන ගැලපීම් පිළිබඳ නිසි සුපරීක්ෂණයක් නොවීම හේතුවෙන් 2011 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අවසන් ගිණුම අනුව අවිනිශ්චිත ගිණුමේ රු: 372,416 ක හර ශේෂයන් පැවති අතර එය සමාලෝචිත වර්ෂයේ දී රු: 1,838,725 ක බැර ශේෂයක් දක්වා වර්ධනය වී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට තොග ආගණනයක් සිදු කිරීමකින් තොරව 2008,2009 හා 2010 යන වර්ෂවල ගිණුම්වල පවතින රු: 208,858 ක තොග වටිනාකම සමාලෝචිත වර්ෂයේ තොග ලෙස ද ගිණුමට ගෙන තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

(අ) අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා විෂයන් 08 ට අදාල එකතුව රු: 7,710,113 ක්වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකිය.

**(ආ)** සමාලෝචිත වර්ෂයේ ආයෝජන යටතේ රු: 86,100 ක් දක්වා තිබුණද රු: 56,100 ක් සඳහා වූ ස්ථාවර තැන්පතු සහතික හෝ පවතින බැංකුව පිළිබඳ විස්තර නොවූ අතර ගිණුම්වල දිගින් දිගටම මෙම ශේෂය පෙන්නුම් කර තිබුණි. ඉතිරි රු: 30,000 ක ස්ථාවර තැන්පතු ශේෂය දිස්ත්‍රික් සංවර්ධන සභාව පැවති කාලයේ සිට පැවත එන ශේෂයක් වන බවත් ඒ පිළිබඳව කිසිදු තොරතුරක් නොවන බවත් අනාවරණය විය.

## 2 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු: 542,729 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු: 1,111,126 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| i. | වරිපනම් හා බදු | 530 | -- | 530 |
| ii. | බදු කුලී | 256 | 68 | 188 |
| iii. | බලපත්‍ර ගාස්තු | 744 | 687 | 57 |
| iv. | සේවා සඳහා ගාස්තු | 1,295 | 235 | 1,060 |
| v. | වරෙන්තු ගාස්තු | 2,044 | 1,272 | 772 |
| vi. | වෙනත් ආදායම් | 1,857 | 1,517 | 340 |

---

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ මුදල් රු: 5,292,132 ක් ද මුද්දර ගාස්තු රු: 169,708 ක් ද විය.

### 2.2.3 සේවක ණය

සභාවේ ස්ථිර සේවයේ නියුතුව සිටි කාර්යාල කාර්ය සහායකයෙකු සහ ජල කම්කරුවකු 2012 අප්‍රේල් 11 දින සිට සේවයට නොපැමිණ ඇති අතර ඔවුන්ගෙන් අයවිය යුතුව තිබූ රු: 94,309 සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 ජල ගාස්තු

------------

රාජ්‍ය ආයතන 11 කින් සමාලෝචිත වර්ෂයේදී රු: 159,097 ක ජල ගාස්තු අයකර ගෙන නොතිබුණි.

2.3 අවිධිමත් ගනුදෙනු

---------------------

(අ) 2011 වර්ෂයේ පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ දාස්ගිරිය ඉසිපතනාරාම විහාරස්ථාන පිරිවෙණට ඩෙස්ක් බංකු ලබා දීම පිණිස 2011 දෙසැම්බර් 25 දින රු: 74,850 ක මුදලක් පෞද්ගලික ආයතනයකට ගෙවා තිබුණි. එම ගෙවීමට අනුව 2’×6’×3’ ප්‍රමාණයේ ඩෙස්ක් 21 ක්ද, 1’.5’’× 1’.6’’ ප්‍රමාණයේ බංකු 13 ක් ද, ලබාගෙන ගබඩා තොග පොත්වලට ඇතුළත් කර එම පිරිවෙණට නිකුත් කර තිබුණි. මේ පිළිබඳව 2013 අප්‍රේල් මාසයේදි සිදුකරන ලද විගණන පරීක්ෂාවේ දී ඩෙස්ක් 12 ක් සහ බංකු 10 ක් සහ ගුරු මේස 03 ක් සපයා දී තිබූ බව අනාවරණය විය.

(ආ) 2012 අප්‍රේල් 11 වන දින සිට සේවය හැර ගොස් ඇති සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් කාර්යාල කාර්ය සහයකයින් දෙදෙනෙකුට අප්‍රේල් මාසයට නියමිත වැටුප ගෙවා තිබුණෙන් රු: 27,939 ක වැටුපක් වැඩිපුර ගෙවා තිබූ බව අනාවරණය විය.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 හා 6.3 මාර්ගෝපදේශ වලට හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 207 හා 208 රීති ප්‍රකාරව තරඟකාරී ලංසු ක්‍රමය හා ලියාපදිංචි තැපැල් මඟින් ප්‍රසම්පාදන මිල ගණන් කැඳවිය යුතු වුවත් ඊට පටහැනිව අත්මිල ගණන් මත සමාලෝචිත වර්ෂයේ අවස්ථා 06 කදී රු: 364,939 ක ගබඩා ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගෙන තිබුණි.

### 2.4 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

වටිනාකම රු: 828,250 ක්වූ වත්කම් ඒකක 04 ක් හා වටිනාකම ගණනය කර නොමැති වත්කම් ඒකක 02 ක් නිෂ්ක්‍රීයව හෝ ඌණ උපයෝජිතව පැවතිණි.

## 2.5 කොන්ත්‍රාත් පරිපාලනය

(අ) 2012 වර්ෂයේ එක ගමකට එක වැඩක් ව්‍යාපෘතිය යටතේ රු: 973,918 ක වියදමින් නාරංගමුව ප්‍රදේශයට පානීය ජලය ලබා දීම සඳහා වූ ව්‍යාපෘතිය නාරංගමුව සමෘද්ධි සමිතියට ලබා දී තිබුණු නමුත් ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට භාරදී නොතිබුණු අතර දින 225 ක් සඳහා ප්‍රමාද ගාස්තු ලෙස රු: 39,200 ක් අයකොට නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ එක ගමකට එක වැඩක් ව්‍යාපෘතිය යටතේ රු: 974,425 ක ප්‍රතිපාදන වෙන්කර ලග්ගල - පල්ලේගම නගරයට ජලය ලබා දීමට කටයුතු කර ඇතත් ඇස්තමේන්තු කර ඇති පරිදි පකිස්ථාන වර්ගයට අයත් GI වර්ගයේ නල වෙනුවට ඊට බාල වර්ගයට අයත් නල යොදා තිබුණු අතර නියමිත පරිදි නල යටකර පස් දමා නොතිබුණු බව 2013 අප්‍රේල් 03 දින කරන ලද පරීක්ෂණයේදී අනාවරණය විය.

(ඇ) 2010 වර්ෂයේ ජාතික සවිය ගම නැගුම ව්‍යාපෘතිය යටතේ ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැද ඇල ප්‍රධාන මාර්ගය කොන්ක්‍රීට් කිරීම ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු: 700,000 ක ඇස්තමේන්තුවකට ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය සභාවට අනුඥාත කර තිබුණි. 2010 සැප්තැම්බර් 08 දින මැද ඇල සමෘද්ධි සමිතිය වෙත රු. 700,000 ක මුදලක කොන්ත්‍රාත්තුව පවරා රු.549,080 ක්ද ගෙවීම් කර තිබුණි. කොන්ත්‍රාත්තුවේ වැඩ නිසි ලෙස ඉටු නොකිරීම නිසා අවසන් බිල්පත වූ රු: 131,046 ක ගෙවීම් ප්‍රාදේශීය ලේකම් විසින් අත්හිටුවා තිබුණි. එහෙත් ප්‍රාදේශීය සභාව විසින් කොන්ත්‍රාත්කරුට සභා අරමුදලින් 2011 ජනවාරි 06 දින රු: 50,000 ක් ගෙවා තිබීම සභා අරමුදලට වූ පාඩුවක් බව නිරීක්ෂණය විය.

## 2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

(අ) 2008 වර්ෂයට පෙර හත්තොට අමුණ පුස්තකාලයේ ආපසු භාර දී නොතිබු පොත් 339 ක් සම්බන්ධයෙන් වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු අංක 252 – 6565 දරන ඩබල් කැබ්රථය අනතුරට පත්වීම හේතුවෙන් සිදුව තිබූ රු: 37,850 ක අලාභය අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට හෝ ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර හෝ නොතිබුණි.

(ඇ) සභාව සතු වූ රු: 30,000 ක් වටිනා සෝනි වර්ගයේ ඩිජිටල් කැමරාව අක්‍රීය වීම නිසා වටිනාකම එම කැමරාව භාරව සිටි කාර්මික නිලධාරියාගෙන් අයකළ යුතු බවට සභාව තීරණය කර තිබුණ ද එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඈ) මැණික් පතල් කැණීම සඳහා අනුමැතිය ලබා දීමේ දී රු: 2,000 ක බලපත්‍ර ගාස්තු මුදලක් අයකරනු ලබන අතර මෙසේ අවසර ලබා දීමේ දී සභාවේ ආදායම් පරීක්ෂකගේ නිර්දේශය ද සහිතව සභාපතිවරයාගේ අනුමැතිය ද, මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ නිර්දේශය ද සහිතව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ අනුමැතියට ඉදිරිපත් කිරීමෙන් පසුව අවසරපත්‍ර ලබාදිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ නිකුත්කරන ලද අවසරපත්‍ර වලින් 120 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු නොකර සභාපතිවරයාගේ

---

අනුමැතිය පමණක් ලබා දී තිබුණු අතර මේ සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොගෙන සභා තීරණයක් මත කටයුතු කරන බව අනාවරණය විය.

**(ඉ)** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය ප්‍රකාරව සභාවේ බලතල සහ කාර්යයන් ඉටු කිරීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය, කාර්මික සේවා හා පරිසර පහසුකම් සඳහා වූ කමිටු පවත්වා ගෙන යාම සිදුකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ කිසිදු අවස්ථාවක කමිටු පවත්වා නොතිබුණි.

(ඊ) සභා බල ප්‍රදේශයේ ඇති ගංගා වැලි ප්‍රවාහනය කිරීම, වරිපණම්, මැණික් කැණීම් අවසර පත්‍ර ලබා දීම, ත්‍රීරෝද රථ ගාස්තු අය කිරීම, සම්ප්‍රේෂණ කුළුණු ආදිය මඟින් සභාවට යම් ආදායමක් ලබා ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් එකතු කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.7 <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය.</u>

සභා බල ප්‍රදේශයේ විධිමත් ලෙස කසල බැහැර කිරීමේ වැඩ පිළිවෙළක් නොවීම හේතුවෙන් එකතුවන කසල වෙන් කිරීමකින් තොරව සභාවේ ට්‍රැක්ටරයක් හා සේවකයින් යොදා සතියකට වරක් බලගොල්ල යාය ප්‍රදේශයේ ඇති පෞද්ගලික ඉඩමකට බැහැර කරන බවත් කසල බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකරන අතර කසල ප්‍රතිචක්‍රීකරණ වැඩ සටහන් සඳහා සභාවේ අවධානය යොමු වී නොමැති බවත් නිරීක්ෂණය විය.

## 3 <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අයවැය පාලනය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) කොන්ත්‍රාත් පාලනය

(ඈ) ගබඩා පාලනය

(ඉ) වත්කම් කළමනාකරණය